**ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (ඇපයෙන්) සීමිත සමාගම - 2014**

-----------------------------------------------------------------------

ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (ඇපයෙන්) සීමිත සමාගමේ (“සමාගම”) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරකම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 24 ඡේදයේ 4(බී) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ඉහත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (“සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති”) වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“මණ්ඩලය”) වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීකත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන
------------------

### 2.1 තත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (ඇපයෙන්) සීමිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (" කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති") අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති හා අනුකූල වීම
------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති කාල සීමාව සම්බන්ධයෙන් ආදායම හා වියදම පමණක් ගිණුම්ගත කළ යුතු වුවත්, ඊට පටහැනිව 2013 වර්ෂයට අදාල රු.106988 ක පරිපාලන වියදම් සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම් ලෙස ගෙන තිබුණි.

(ආ) වාහන සඳහා ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය සටහනක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව, සමාලෝචිත වර්ෂයේ මුදල් අමාත්‍යාංශයෙන් ලැබුණු ලී බඩු හා උපකරණ ආරම්භක ශේෂයේ වටිනාකම රු.54,755,323 ක් විය. නමුත්, එය රු.56,919.578 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. ඒ අනුව, විගණනයේදී රු.2,164,255 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) පරිගණක සඳහා රු.73,973 ක ක්ෂය ගිණුම්ගතකර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) පරිගණක දෝෂයක් හේතුවෙන් ස්ථාවර වත්කම් පොලී ආදායම හා ලැබිය යුතු පොලී ආදායම පිළිවෙලින් රු.516,429 කින් හා රු.1,004,333 කින් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය රු.516,429 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) රු.34,444 ක් වූ සමාලෝචිත වර්ෂය සඳහා වත්කම් ප්‍රදාන වලට අදාල ක්‍රමක්ෂය අතිරික්තව ගණනය කර ඇති අතර ආදායමට බැර කර තිබුණි.

(ඉ) සමාගම යටතේ ක්‍රියාත්මක වන මිලෝදා ආයතනයට අයත් වත්කම් හා බැරකම්වල ආරම්භක ශේෂයන්ට සිදුකරන ලද දෝෂ සහගත ගැළපීම් හේතුවෙන්, පහත දැක්වෙන ගිණුම් රු.2,380,680 කින් වැඩියෙන් දක්වා තිබුණි.

| ගිණුමේ නම | වටිනාකම |
| --- | --- |
| | රු. |
| ලී බඩු හා උපකරණ | 1,082,127 |
| රඳවාගත් ඉපැයීම් | 679,707 |
| පොදු අරමුදල | 339,296 |
| ලී බඩු හා උපකරණ සඳහා ක්ෂය | 108,213 |
| ලී බඩු හා උපකරණ සඳහා සමුච්චිත ක්ෂය | 171,337 |
| | 2,380,680 |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.4,748,242 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.6,941,091 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,192,849 ක පිරිහීමක් දැක්වුණි. පුහුණු වැඩසටහන් වියදම හා පරිපාලන වියදම්වල වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් ප්‍රතිඵලය

### 4.1 කාර්ය සාධනය

සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ (B) 2 (F) වගන්තිය අනුව, අදාළ පර්යේෂණවල නියැලීම හා පොත් සඟරා, වාර්තා හා එවැනි වෙනත් ප්‍රකාශන මුද්‍රණය සමාගමේ ප්‍රධාන අරමුණු වේ. නමුත් සමාලෝචිත වර්ෂයේදී මෙම අරමුණු ඉටුකර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි.

### 4.2 කළමණාකරණ දුර්වලතා

විදුලි බිල් නිරවුල් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.257,505 ක් පොලී වියදම් ලෙස ගෙවීමට සිදු වී තිබුණි.

### 4.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වරකට නිළධාරීන් 1,019 ක් පුහුණු කිරීමට පහසුකම් තිබුණද, පුහුණු වැඩසටහන් 53 ක් පමණක් පවත්වා තිබුණු අතර නිළධාරීන් 5,123 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදී පුහුණුකර තිබුණි.

(ආ) මේසය මතුපිට තබන පරිගණක විස්සක් හා අතේ ගෙන යා හැකි පරිගණක 38 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ද උපයෝජනය කර නොතිබුණි.

4.4 වෙනත් රාජ්‍ය ආයතනවලට ලබාදුන් සමාගමේ සම්පත්

---

2015 ජනවාරි 23 දින මුදල් අමාත්‍යාංශයට ලබාදුන් වටිනාකම රු.4,279,691 ක් වූ වාහනයක් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

4.5 මානව සම්පත් කළමණාකරණය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පත්වීම් සිදු කරනු ලබන බලධාරියාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව, සමාගම විසින් මුදල් අමාත්‍යාංශයෙන් නිදහස් කරන ලද නිළධාරියෙකුගේ කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කර තිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (ඩී) ඡේදය ප්‍රකාර සමාගමේ සංවිධාන සැලැස්ම හා අනුමත කාර්ය මණ්ඩලය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

---

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාර ආයතනය විසින් කෙටුම්පත් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාගම විසින් ගිණුම් ඉදිරිපත් කර තිබුණේ 2016 ජුනි 23 දිනදීය.

5.2 සංයුක්ත සැලැස්ම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාර සමාගම විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්ම ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2015 දෙසැම්බර් 31 දින දක්වාම සමාගම විසින් එය විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව වාර්ෂික අයවැය සකස් කර, ඊළඟ මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට ප්‍රථම විගණකාධිපති වෙත පිටපත් එවිය යුතු වුවත්, එය අදාළ කාල සීමාව තුළ නිවැරදි ආකෘතිය සහිතව සිදු කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සමාගමේ ප්‍රධාන විධායක නිළධාරීගේ අවධානය සඳහා වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රයන් | | විගණන නිරීක්ෂණ |
|---|---|---|
| ---------------------- | | ----------------------- |
| ගිණුම්කරණය | i | අනාවරණය නොකිරීම. |
| | Ii | දෝෂසහගත ගිණුම්කරණ දැක්වීම. |
| | Iii | ගිණුම්වල වැඩියෙන් දැක්වීම් හා අඩුවෙන් දැක්වීම්. |
| මානව සම්පත් | i | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛවල විධිවිධානයන්ට අනුකූල නොවීම. |
| | ii | ස්ථිර පදනම මත නොව කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවාගෙන තිබීම. |